POST GRADUATE INSTITUTE OF ENGLISH

# පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## ඇබෑර්තුව - අධ්‍යක්ෂ තනතුර

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් 2021 ඔක්තෝබර් 15 වැනි දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

අපේක්ෂිත අයදුම්කරු සතුව පශ්චාත් උපාධි සුදුසුකම් (ඉංග්‍රීසි/ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය (Ph.D.) උපාධියක් ලබා තිබීම සඳහා වැඩි සැලකිල්ලක්) හා පරිපාලන පළපුරුද්දක් තිබිය යුතුය. අධ්‍යයන නායකත්වය ලබාදීම හා විශ්වවිද්‍යාලය තුළ අනෙකුත් සංවිධාන සමග හා අනෙකුත් දේශීය හා ජාත්‍යන්තර අධ්‍යයන ආයතන සමග රාජකාරීමය සබඳතාවයන් පිහිටුවා ගැනීම සාර්ථක අපේක්ෂකගේ වගකීම වේ. ඔහු/ ඇය සතුව විශිෂ්ට අන්තර් පුද්ගල සබඳතා පිළිබඳ නිපුණතාවය තිබිය යුතු අතර, ප්‍රජාව කෙරෙහි ආයතනයේ වගකීම් පිළිබඳව අවබෝධයක් තිබිය යුතුය. දුරස්ථ අධ්‍යාපනයේ ඉගැන්වීම්/ ඉගෙනීම් පිළිබඳ පළපුරුද්ද වාසියක් වනු ඇත.

2005 අංක 04 දරන පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන පනතේ නියමයන් පරිදි අධ්‍යක්ෂ, ආයතනයේ, පූර්ණ කාලීන නිලධාරියෙකු, ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අධ්‍යයන නිලධාරී හා ගිණුම්කරණ නිලධාරී වේ. තවද, අධ්‍යක්ෂ කළමනාකරණ මණ්ඩලයේ සභාපති වන අතර ආයතනයේ අධ්‍යයන කමිටුවල නිල බලයෙන් සාමාජිකයෙකු ද වේ. පත්කරනු ලබන අධ්‍යක්ෂ, පත්වීම් දිනයේ සිට වසර තුනක කාලයක් හෝ වයස අවු. 65 සම්පූර්ණ කරන දිනය දක්වා යන මේ සිද්ධීන් දෙකෙහි පළමුව පැමිණෙන දිනය දක්වා තනතුර දැරිය යුතුය.

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම හා ඉංග්‍රීසි ගුරු අධ්‍යාපනය පෝෂණය කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා විශේෂයෙන් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය පිහිටුවන ලදි. පසුගිය කාලය තුළදී ආයතනයේ පැතිකඩය සැලකිය යුතු අන්දමින් වර්ධනය වී ඇති අතර, ඉංග්‍රීසි අධ්‍යයනයට අදාළ බොහෝ ක්ෂේත්‍රවල මෙම ආයතනය විසින් පාඨමාලා පවත්වනු ලැබේ.

හොඳ අධ්‍යයන පසුබිමක් සහිත පර්යේෂණ හා කළමනාකරණය පිළිබඳ විශිෂ්ට රාජකාරී වාර්තාවක් හා මෙම අභියෝගයන්ට මුහුණ දීමට හා ජය ගැනීමට දක්මක් ඇති අයෙකු කළමනාකරණ මණ්ඩලය සොයයි.

මාසිකව U-AC5 පරිමාණයේ 2020 වර්ෂයේ සිට රු. 117,350-13X2700-152,450/= ක මාසික වැටුපක් හා තනතුරට අදළ දීමනාවන් ලබාගැනීමට අධ්‍යක්ෂට හිමිකම් ඇත. දැනට රාජ්‍ය සේවයේ නියුතු හා දැනට ඉහත සඳහන් වැටුප් පරිමාණය ඉක්මවා වැටුප් ලබන්නන් සමාන වැටුප් තලයක පිහිටුවනු ලැබෙනු ඇත. අයදුම්කරු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ නිර්ණය කොට ඇති පරිදි ගුරුවරයෙකු නම් මූලික වැටුපෙන් 162% ක අධ්‍යයන දීමනාවක් ගෙවනු ලැබේ.

**අධ්‍යක්ෂට හිමි අනෙකුත් ප්‍රතිලාභ නම් ;**

- රජය විසින් අනුමත කරන ලද ප්‍රවාහන දීමනා
- මූලික වැටුපෙන් 12% ක් සංග්‍රහ දීමනා
- විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල
- සේවක භාරකාර අරමුදල් දායකත්වය

**පහත සඳහන් ලිපිලේඛන අයදුම්පත සමග අමුණා එවිය යුතුය.**

- අයදුම්කරුගේ උපන් දිනය ඇතුළු ජීව දත්තයේ පිටපතක්
- ආයතනය සංවර්ධනය කිරීම සඳහා වන දැක්ම පිළිබඳ ප්‍රකාශයක්, හා අධ්‍යක්ෂ තනතුරට පත් කරගතහොත් අයදුම්කරු විසින් ඉටුකර ගැනීමට යෝජනා කරන දෑ පිළිබඳ කෙටි සටහනක්.
- ඔහු / ඇය තනතුරට පත්කර ගත හොත් ඔහුව/ ඇයව නිදහස් කළ හැකි බවට සේවාව යෝජක වෙතින් ලිපියක් (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය හැර අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල, රාජ්‍ය සේවයේ, සංස්ථාවල හා ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන්ට පමණක් අදාළ වේ.)

අයදුම්කරු, කෙටි ලැයිස්තුගත කළහොත් ආයතනය සඳහා වන ඔහුගේ/ ඇයගේ දැක්ම කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

මුද්‍රා තබන ලද අයදුම්පත්, 2021 ඔක්තෝබර් 15 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, තැ. පෙ. 21, නාවල, නුගේගොඩ"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ අතින් ගෙනැවිත් භාරදිය හැකිය.

අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර **"පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යක්ෂ තනතුර"** යනුවෙන් සඳහන් කළ යුතුය.

අසම්පූර්ණ හෝ අවශ්‍යතාවන්ට අනුකූල නොවන හෝ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ කළමනාකරණ මණ්ඩලයේ ලේකම්,**

**පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය,**
**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය,**
**තැ. පෙ. 21, නාවල, නුගේගොඩ.**
**දුරකථනය : 0112825805 ඊමේල් sarpgie@ou.ac.lk**